දිනමිණ
2020/06/24
පිටු අංක 17

# අප්‍රේල් මාසයේදී විදෙස් ශ්‍රමිකයනගෙන් ඩොලර් මිලියන 375ක්

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදෙන විදේශ ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මෙරටට එවන මුදල පසුගිය අප්‍රේල් මාසයේ දී අමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 375 ක් වූ බව ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වාදෙයි.

කෙසේ වුවද මෙය පසුගිය 2019 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව පහත වැටී-මක් බව පෙන්වාදෙන ශ්‍රී ලංකා මහ බැංකුව 2019 වසරේ අප්‍රේල් මාසයේ දී විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ඇමෙරිකානු ඩොලර් මිලියන 554ක් පමණ මෙරටට ප්‍රේෂණය කර තිබෙන බවද ඒ අනුව මේ වසරේ එම මාසයේ දී සියයට 32.3ක පමණ පහත වැටීමක් සිදුව බවද සඳහන් කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්තවලට අනුව පසුගිය වසරේ මුල් මාස හතරේ දී මෙර-ටට ලැබී ඇති ප්‍රේෂණ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 2,171ක් වන අතර ඊට සාපේක්ෂව මේ වසරේ දී ලැබී ඇති ප්‍රමා-ණය ඇමෙරිකානු ඩොලර් මිලියන 1,975කි. ඒ අනුව එම අගය ද සියයට 9ක පහළයෑමක් බව ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ නවතම වාර්තාවක් මඟින් පෙන්වාදෙයි.

නව කොරෝනා වසංගතය හේතුවෙන් පසුගිය අප්‍රේල්, මැයි සහ ජූනි යන මාසවල දී මැද පෙරදිග සිටි ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් 8,000ක පිරිසක් නැවත මෙරටට පැමිණ ඇතැයි ද තවත් 40,000ක් මෙරටට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටින අතර ඔවු-න්ගෙන් 25,000කට ආසන්න පිරිසක් මෙරටට ගෙන්විය යුතුව සිටින බවද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහන් කරයි.